# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2316/45 - 2023 ජනවාරි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2023.01.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**තැපැල් කාර්යාල ආඥාපනතේ (190 වැනි අධිකාරිය) 45 වගන්තිය යටතේ සකස් කරනු ලබන රීතියයි**

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා නිකුත් කළ මුදල් ඇණවුම්

01. මුදල් ඇණවුමක් වලංගු වන්නේ එය නිකුත් කළ මාසයේ අවසන් දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා පමණි. එහෙත්, වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුමකට විශේෂ අවස්ථා අනුව සලකා එය නිකුත් කළ මාසයේ අවසන් දිනයේ සිට අවුරුදු දෙකක් දක්වා මුදල් ගෙවීම ගැන සලකා බලනු ලැබේ. කෙසේ වුවත්, නිකුත් කල මාසයේ අවසන් දින සිට අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුමක් නැවත වලංගු කිරීමට හෝ එහි වටිනාකම ආපසු ගෙවීමට හෝ නොහැකි අතර, එම මුදල් ඇණවුම් වල වටිනාකම රජයේ ආදායමට බැර කරනු ලැබේ.

02. එසේ වුවත්, පහත සඳහන් විශේෂ අවස්ථා යටතේ අවුරුදු දෙකක් ඉක්මගිය මුදල් ඇණවුම්වල වටිනාකම අදාල ගාස්තු අයකර ගැනීමෙන් පසු රජයේ ආදායමෙන් ආපසු ගෙවීම ගැන සලකා බැලිය හැක.

i. මුදල් ඇණවුම් අධිකරණය වෙත් ඉදිරිපත් කර තිබීම.
ii. නීතිමය හේතුන් මත ගෙවල් කුලී පාලක මණ්ඩලයක් මගින් මුදල් ඇණවුම් රඳවාගෙන තිබීම.
iii. මුදල් ඇණවුමේ මුදල ලැබිය යුතු අය විදේශගත වී සිටීම. (විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය)
iv. මුදල් ලැබිය යුතු අය දීර්ඝකාලීනව දැඩි අයහපත් සෞඛ්‍ය තත්ත්වයකින් පසුවීම. (රජයේ වෛද්‍ය නිලධාරියකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය.)

03. ඉහත 02(i) හා (ii) යටතට අදාල මුදල් ඇණවුම් මෙම *ගැසට්* නිවේදනයේ පළකරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත ඉදිරිපත් කළ නොහැකි නම් එවැනි මුදල් ඇණවුම් පිළිබඳ විස්තර අදාල නඩු අංක ආදී සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත ලිඛිතව එවිය යුතුය. මුදල් ඇණවුම් ඉදිරිපත් කිරීමට අපහසුවන්නේ නම් ඒ බව ලිඛිතව දැන්විය යුතුය.

04. එහෙත් දැනට අධිකරණයේ පවතින නඩු වෙනුවෙන් හා වෙනත් නීතිමය අවශ්‍යතාවයන් සඳහා උසාවි නියෝග මගින් රඳවා ඇති මුදල් ඇණවුම්, ගෙවල් කුලී පාලක මණ්ඩලයක නඩු සම්බන්ධයෙන් රඳවා ගතයුතු මුදල් ඇණවුම්, දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ මට්ටමින් කරගෙන යනු ලබන විනය පරීක්ෂණයක් සඳහා පාදක වූ මුදල් ඇණවුම් මෙමගින් ආවරණය නොවේ.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. 2019.01.01 වන දින සිට 2019.12.31 වන දින දක්වා නිකුත් කරන ලද මුදල් ඇණවුම්වලට අදාලව මෙම නිවේදනය පළකල දින සිට මාස තුනක් සම්පූර්ණ වන දින තෙක් ලැබෙන පැමිණිලි පමණක් සලකා බැලීමට තීරණය කර තිබේ. මෙය සාමාන්‍ය මුදල් ඇණවුම්, විද්‍යුත් මුදල් ඇණවුම්, ෆැක්ස් මුදල් ඇණවුම් හා වටිනාකම ගෙවා භාර ගන්නා මුදල් ඇණවුම් සඳහා අදාල වේ. ඉහත 02 ජේදයේ සඳහන් අවස්ථා යටතේ වූ මුදල් ඇණවුම්වල වටිනාකම රාජ්‍ය ආදායමට බැර කර ඇත්නම් එම මුදල් ඇණවුම්වල වටිනාකම මුදල් රෙගුලාසිවලට අනුව ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස සලකා අදාල පාර්ශව වලට ගෙවීමට කටයුතු කරනු ලැබේ.

06. එබැවින්, ඉහත 02 ජේදයේ සඳහන් පරිදි මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවීම ගැන සලකා බැලීම පිණිස ලිඛිතව කරනු ලබන ඉල්ලීම් හා අදාල මුදල් ඇණවුම් ද සමග මුදල් ඇණවුම් සේවා පාලක වෙත පහත සඳහන් ලිපිනයට මෙම *ගැසට්* නිවේදනය පළකල දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු බවට ඒ ඒ පළාත් සඳහා, පළාත් පාලන ආයතන, ගෙවල් කුලී පාලක මණ්ඩලය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයේ ආයතන, බැංකු, පුද්ගලික ආයතන සහ මහජනයා වෙතද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පාලක, මුදල් ඇණවුම් සේවා
මුදල් ඇණවුම් සේවා අංශය
නියෝජ්‍ය තැපැල්පති (මධ්‍යම) කාර්යාලය
තැපැල් සංකීර්ණය
තැපැල් දෙපාර්තමේන්තුව
මහනුවර

07. තවද, 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා කාලය තුළ නිකුත් කරන ලද, මෙම නිවේදනයේ දෙවන ජේදයේ දැක්වෙන කරුණු හතරට අදාල වන වලංගු කාලය ඉකුත් වූ මුදල් ඇණවුම් සඳහා මුදල් ආපසු ගෙවන ලෙස මෙම *ගැසට්* නිවේදනය පළකල දින සිට මාස තුනකට පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් භාර නොගන්නා බවත් එම මුදල් ආපසු ගෙවනු නොලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

08. 2019.01.01 දිනට පෙර නිකුත් කරන ලද කිසිදු මුදල් ඇණවුමක් සඳහා කුමන හේතුවක් මත හෝ මුදල් ආපසු ගෙවනු නොලැබේ.

**ශාන්ත බණ්ඩාර** (පා.ම),
ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය.

2023 ක් වූ ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.